## 04 ව්‍යවසායකත්වය සහ කුඩා පරිමාණ ව්‍යාපාර

❖ **කුඩා පරිමාණ ව්‍යාපාරවල සීමා**

කුඩා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමේ දී ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බාධා පමුණුවන හෝ ක්‍රියාකාරීත්වය සීමා කරවන සාධක සීමා ලෙස හැඳින්වේ.
කුඩා පරිමාණ ව්‍යාපාර බොහෝ අවස්ථාවල මුහුණදෙන සීමාවන් ලෙස ,

- ව්‍යාපාරයට අවශ්‍ය ප්‍රාග්ධනය රැස්කර ගන්නා මාර්ග සීමා වීම.
- නවීන තාක්ෂණය භාවිත නොවීම.
- වෙළඳපල සීමා වීම.
- ව්‍යාපාරික කටයුතුවලට තම පවුලේ සාමාජිකයන්ගේ මැදිහත් වීම වැඩිවීම.
- ව්‍යාපාර හිමිකරුගේ ව්‍යාපාරික පළපුරුද්ද සහ දැනුම සීමාකාරී වීම.

❖ **කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු**

- ව්‍යාපාරයේ මුදල් කටයුතු පාලනය දුර්වලවීම.
- තරඟකාරිත්වයට මුහුණදීමට නොහැකි වීම.
- ව්‍යාපාරික කටයුතු සැලසුමකින් තොරව සිදු කිරීම.
- බොහෝ ව්‍යාපාරිකයන් ව්‍යවසායකයන් ලෙස නොසිතීම.
- ව්‍යාපාරයේ පවතින සම්පත් නිවරදිව පාලනය නොකිරීම.
- ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් පවතින පළපුරුද්ද ප්‍රමාණවත් නොවීම.
- දුර්වල මානව සම්බන්ධතා.

අභ්‍යාස 01 -: ඔබ ප්‍රදේශයේ අසාර්ථක වූ කුඩා පරිමාණ ව්‍යාපාර හඳුනාගෙන අසාර්ථක වීමට හේතු ගොනුකරන්න.

(පෙළපොත පිටු අංක 49 සහ 50 අධ්‍යයනය කරන්න)

INDIKA BAMBARAGAMA - KALYANI M.V.

## භූගෝල විද්‍යාව

## 4. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය - (වී වගාව)

- ශ්‍රී ලංකාව අතීතයේ සිටම කෘෂි ආර්ථිකයක් පැවති රටක් ලෙස හැඳින්විය හැකිය. එදා සිට අද දක්වාම ශ්‍රී ලංකාවේ ආර්ථිකය මෙන්ම සංස්කෘතියද කෘෂිකර්මය හා බැඳී පවතී.
- ශ්‍රී ලංකාවේ වී වගාව යටත් විජිත යුගය තුළ පරිහානියට පත් වූවද නිදහසෙන් පසු වියළි කලාපයේ ගොවි ජනපද පිහිටවීම, වැව් ප්‍රතිසංස්කරණය, හරිත විප්ලවය යනාදිය තුළින් නැවත දියුණු විය.
- බෝඹුවල, මහඉලුක්පල්ලම, බතලේගොඩ, හිඟුරක්ගොඩ, අම්බලන්තොට මෙරට වී පර්යේෂණ ආයතන පිහිටා තිබේ.
- ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම වී වගාව ව්‍යාප්තව ඇති අතර මෙම ප්‍රදේශ විවිධ පාරිසරික කලාප අනුව කොටස් 4කට වෙන් කර ඇත.
    1. වියළි කලාපය
    2. අතරමැදි කලාපය
    3. තෙත් කලාපය
    4. කඳුකර බිම්

**ක්‍රියාකාරකම**

1. ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලංකාවේ වී වගා කරන ප්‍රධාන කලාප 4 වෙන් කර වර්ණ හතරකින් සේයා කර දක්වන්න. වී පර්යේෂණ ආයතන රතු පැහැයෙන් ලකුණු කර නම් කරන්න. ශ්‍රී ලංකාවේ වී වගාව අඩුම දිස්ත්‍රික්කය තිත් සටහන් මගින්ද වැඩිම දිස්ත්‍රික්කය ඉරි සටහන් මගින්ද සේයා කර නම් කරන්න.

2. ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශයන්හි වී වගාව ව්‍යාප්ත වීම කෙරෙහි බලපා ඇති සාධක ලියන්න.

3. වී පර්යේෂණ ආයතන මගින් ශ්‍රී ලංකාවේ වී වගාව දියුණු කිරීමට ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

H V K JAYAWARDANA - HIGURANA K.V.